# අඟහරුවාදා

## පළමුවන කියැවීම

ගණන් කථාවෙන් ගත් පාඨයෙකි. ගණන් කථාව 21: 4-9

**කාන්තාරයේ දී රිට මත ඔසවන ලද**
**සර්පයා දෙස බැලූ සියල්ලෝ සුවපත් වූහ.**

ඔව්හු හෝර් නම් කඳුකරයෙන් නික්ම රතු මුහුදට යන මාර්ගය ඔස්සේ ඒදොම් නම් දේශය වටකර ගියහ. මෙසේ යන විට සෙනග බොහෝ සේ අධෛර්යයට පත් වූහ. සෙනග දෙවියන් වහන්සේට සහ මෝසෙස්ට විරුද්ධව කතා කරමින් "මේ පාළුකරයේ අප මැරෙන්නට ඇරීමට ඔබ අප මිසරයෙන් පිටතට ගෙනාවේ මන්ද? අපට කන්නත් නැත. බොන්නත් නැත. අපට ලැබෙන මේ සිල්ලර කෑම අපට දැන් තිත්ත වී ඇතැ"යි පැවසූහ. එවිට සමිඳාණන් වහන්සේ සෙනග මැදට විසකුරු සර්පයන් එවූ විට ඒ සර්පයෝ ඔවුන්ට දෂ්ට කළහ. ඉශ්රායෙල් සෙනග අතරේ බොහෝ දෙනෙක් නැසී ගියහ. එබැවින් සෙනග මෝසෙස් වෙත පැමිණ "අපි සමිඳාණන් වහන්සේටත් ඔබටත් විරුද්ධව කතා කිරීමෙන් පව් කළෙමු. මේ සර්පයන් අප මැදින් ඉවත් කරන ලෙස උන් වහන්සේට යාච්ඤා කරන්නැ"යි ඉල්ලූහ. මෝසෙස් ද සෙනග උදෙසා යාච්ඤා කළේය. සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට "ලෝකඩ සර්පයෙකු සාදා රිටක් පිට තබන්න. දෂ්ට කරනු ලැබූ යමෙක් ඇද්ද ඔහු එය දෙස බැලුවොත් සුවවනු ඇතැ"යි වදාළ සේක. එවිට මෝසෙස් ලෝකඩ සර්පයෙකු සාදා උෟ රිටක් පිට තැබීය. සර්පයෙක් යමෙකු දෂ්ඨ කළේ ද ඒ තැනැත්තා ලෝකඩ සර්පයා දෙස බැලූ විට ඔහු සුවපත් විය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 102 : 1-2, 15-20

පිළිතුරු: සමිඳුනි, මාගේ යැදුම ඇසුව මැනව.

ගීය:

සමිඳුනි, මාගේ යැදුම ඇසුව මැනව. මාගේ මොරගැසීම ඔබ වෙත පැමිණේවා! මාගේ විපත්ති සමයේ දී ඔබේ මුහුණ මා කෙරෙන් සඟවා නොගත මැනව. යැදුම් පුදන විට මට සවන් දී නොපමාව පිළිතුරු දුන මැනව.

එහෙයින් විජාතීහු සමිඳුන්ගේ නාමයටත් බිය වන්නෝය. පොළොවේ සියලු රජවරු ඔබේ මහිමයට බිය වන්නෝය.
සමිඳාණෝ සියොන් යළි ගොඩ නනන සේක. සිය මහිමාලංකාරයෙන් ප්‍රකාශ වන සේක.

එතුමාණෝ අසරණයන්ගේ යැදුමට සවන් දෙන සේක. ඔවුන්ගේ යැදුම හෙළා නොදකින සේක. මේ තාක් නූපන් අය ඔබට පැසසුම් කරන පිණිස මතු එන පරම්පරාව සඳහා මෙය සටහන් කරනු ලැබේවා!

සමිඳාණෝ සිය ශුද්ධස්ථානයේ සිට පහත බැලූ සේක. එතුමාණෝ ස්වර්ගයේ සිට පොළොව දෙස බැලූ සේක. එසේ කළේ සිරකරුවන්ගේ දුක් සුසුම් අසන්නට ය. මරණයට නියම වූවන් මුදන්න ය.

## සාධුකාරය

"ලෝකයේ ආලෝකය මම ය. මා අනුගාමී වන්නා අඳුරෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ ය"යි ස්වාමීන් වහන්සේ වදාරණ සේක.

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 8 : 21–30

***මනුෂ්‍ය පුත්‍රයාණන් ඔසවා ලූ කල මා උන් වහන්සේ බව ඔබට වැටහෙන්නේය.***

ජේසුස් වහන්සේ යළිත් ඔවුන්ට කතා කොට, "මම ඉවත්ව යමි. ඔබ මා සොයන්නහු ය. එහෙත් ඔබ ඔබේ පාපයෙහි මැරෙන්නහු ය. මා යන ස්ථානයට ඔබට පැමිණිය නොහැකි ය" යි වදාළ සේක. එවිට ජුදෙව්වරු "මා යන ස්ථානයට ඔබට එන්නට නොහැකි ය"යි මොහු කියන්නේ සිය පණ හානි කර ගන්නට යන නිසාවත් දැ"යි ඇසූහ. එබැවින් උන් වහන්සේ කතා කොට "ඔබ මෙලොවින් වන්නහු ය. මම එලොවින් වන්නෙමි. ඔබ මේ ලෝකයෙන් ය. මම මේ ලෝකයෙන් නොවෙමි. ඔබේ පාපයෙහි ම ඔබ මැරෙන්නහු ය"යි මා කීවේ එබැවිනි. මම උන් වහන්සේම යයි ඔබ පිළිගත්තොත් මිස ඔබේ පාපයෙහි ම ඔබ මැරෙන්නහු ය"යි වදාළ සේක. එබැවින් ඔව්හු "ඔබ කවරහු දැ"යි ඇසූහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් "මා ඔබට කී පරිදි මම මුල සිටම ඔබට කී තැනැත්තා ම ය. ඔබ ගැන කියන්නටත් විනිශ්චය කරන්නටත් බොහෝ දේ මට ඇත.

එහෙත් මා එවා වදාළ තැනැත් වහන්සේ සත්‍යය වදාළ බැවින් උන් වහන්සේගෙන් මා ඇසූ දේ මම ලෝකයාට ප්‍රකාශ කරමි”යි වදාළ සේක.

උන් වහන්සේ පියාණන් වහන්සේ ගැන කතාකළ බව ඔවුන්ට අවබෝධ නොවීය. එබැවින් ජේසුස් වහන්සේ කතා කොට “ඔබ මනුෂ්‍ය පුත්‍රයාණන් ඔසවා ලූ කල මා උන් වහන්සේම බවත්, පියාණන් වහන්සේ මට ඉගැන්වූ ලෙස මෙසේ කතාකරනවා මිස, මාගේම අධිකාරීත්වයෙන් මා කිසිවක් නොකරන බවත්, ඔබට අවබෝධ වනු ඇත. මා එවා වදාළ තැනැත් වහන්සේ මා සමඟ වැඩ වසන සේක. උන් වහන්සේ මා තනි වෙන්නට නොහැරිය සේක. මන්ද, මා නිරතුරු උන් වහන්සේට ප්‍රිය මනාප දේ කරන බැවිනි” යි වදාළ සේක. උන් වහන්සේ මෙසේ කතා කරන අතර, බොහෝ දෙනෙක් උන් වහන්සේ අදහා ගත්හ.

සුවිශේෂ වාක්‍යය එසේ ය.